රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 343

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1986 සැප්තැම්බර් මස 25 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

**ත්‍රස්තවාදීන් විසින් පැහැර ගනු ලැබූ හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොටගෙන අතුරුදහන්ව ඇති සන්නද්ධ සේවා සහ පොලිස් නිලධාරීන්ගේ හා රජයේ හා රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි**

ත්‍රස්තවාදීන් විසින් පැහැරගනු ලැබූ හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොටගෙන අතුරුදහන්ව ඇති සන්නද්ධ සේවා නිලධාරියෙකු, පොලිස් නිලධාරියෙකු, රාජ්‍ය නිලධාරියෙකු හෝ රාජ්‍ය සංස්ථා සේවකයකු පිළිබඳව නිශ්චිත තොරතුරක් හෝ ඔහුගේ ඉරණම පිළිබඳ තොරතුරක් හෝ නිශ්චිත වශයෙන් දැනගන්නා තෙක් හෝ, ඔහු වයස 55 ට එළඹෙන තෙක් හෝ යන මේවායින් කලින් එළඹෙන අවස්ථාව දක්වා, ඔහුගේ වැටුප් හා දීමනා ඔහුගේ කලත්‍රයාට/යැපෙන්නන්ට තවදුරටත් ගෙවිය යුතුය.

02. නිලධාරියා වයස අවුරුදු 55 ට එළඹීමෙන් පසු, ඔහුට හිමිවන සාමාන්‍ය විශ්‍රාම ප්‍රතිලාභ ඔහුගේ කලත්‍රයාට/යැපෙන්නන් ආදීන්ට ගෙවිය යුතුය.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.